මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥා පනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතින් සංශොධිත 1950 ගේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි:

කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ බලගල්ලේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 6 ක් පමණවූ පහත සඳහන් මායිම් තුල පිහිටි කුමන්දේවත්ත නැමැති ඉඩම :—

උතුරට: කරත්ත පාර; නැගෙණහිරට: පීටර් අප්පුහාමි, සියදෝරිස් අප්පුහාමි සහ තවත් අය හිමිකම් කියන මීගහවත්ත නමැති ඉඩම; දකුණට: දියකඩිත්ත සහ හපුආරච්චිගේ රොසිහාමි සහ තවත් අය හිමිකම් කියන මීගහවත්ත; බස්නාහිරට: දියකඩිත්ත.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාගී හා විදුලිබල ඇමති.

යොමු අංක: ජේ. 60/61. එල්. 457 වීඊ.—ක්‍යුබී. 498.

1962 ක්වූ ජනවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

2-719

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950ගේ අඩක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි:

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරළේ "බී" කොට්ඨාශයේ වල්පිටමුල්ල ගමේ පිහිටි පහත සඳහන් බිම් කැබලි 2ක:—

(1) දෙල්ගහකුඹුර නමැති ඉඩමෙන් අඩි 278× අඩි 12 ක පමණ ප්‍රමාණය ඇති බිම් කොටසකට මායිම්:

උතුරට: ඒ. ඊ. රෝසා අයිතිකම් කියන මැද්දදුමවත්ත; නැගෙනහිරට සහ බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස්; දකුණට: යූ. ඩී. තේගිස් අප්පුහාමි සහ තවත් අය අයිතිකම් කියන දෙල්ගහවත්ත.

(2) දෙල්ගහවත්ත නමැති ඉඩමෙන් අඩි 297× අඩි 12 පමණ ප්‍රමාණය ඇති බිම් කොටසට මායිම්:

උතුරට: එච්. දොයිසාහාමි සහ තවත් අය අයිතිකම් කියන දෙල් ගහකුඹුර; නැගෙනහිරට සහ බස්නාහිරට: එම ඉඩමේ ඉතිරි කොටස්; දකුණට: ඩබ්ලිව්. පීටර්සිංඤෝ අයිතිකම් කියන කොස් ගහවත්ත.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක: ජේ. 58/59 එල් පී. 93—කිව් බී 529.

1962 ජනවාරි මස 27 දින,
කොළඹදී ය.

2-718

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ, (මැද පත්තුවේ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කිඹගම්මුල්ලේ පිහිටි පර්චස් 32 ක් පමණ ප්‍රමාණය ඇති බුලුගහ වත්ත නමැති ඉඩමට මායිම්:—

උතුරට: ප්‍රන්සිස් බොතේජු සහ පී. ඒ. මිසිනෝනා අයිතිකම් කියන බුළුගහ වත්ත; නැගෙනහිරට: පී. ඒ. මිසිනෝනා අයිතිකම් කියන බුලුගහ වත්ත සහ ඇස්. ඇම්.දිසානායක සහ ඇම්. කේ. ඩී. දනියෙල් අප්පුහාමි අයිතිකම් කියන බුලුගහ වත්ත; දකුණට: කරත්ත පාර; බස්නාහිරට: සී. රණවීර අයිතිකම් කියන බුළුගහ වත්ත.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක: ජේ. 60/61 ඇස්. 484/කවුඩී. 70.

1962 පෙබරවාරි මස 7 දින,
කොළඹ දී ය.

2-743

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

1. කොළඹ දිස්ත්‍රික්කයේ, උතුරු අළුත් කුරු කෝරළේ "ඒ" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අම්බලම්මුල්ල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 7 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි තල්ගහ වත්ත නමැති ඉඩම් කැබැල්ල:—

උතුරට: බී. ඩී. එම්. ප්‍රනාන්දු හිමිකම් කියන තල්ගහවත්ත; නැගෙනහිරට: ඩබ්ලිව්. සමනෝරිස්, එම්. සුවාරිස් ප්‍රනාන්දු, ජේ. තෝමස් ප්‍රනාන්දු සහ ඊ. එම්. ප්‍රනාන්දු හිමිකම් කියන තල්ගහ වත්ත සහ ගම්සභා පාර; දකුණට: වතුර ඇල; බටහිරට: කුඹුරු වලට වතුර ගනු ලබන ඇල පාර සහ ජේ. තෝමස් ප්‍රනාන්දු හිමිකම් කියන තල්ගහ වත්ත.

2. කොළඹ දිස්ත්‍රික්කයේ, උතුරු අළුත් කුරු කෝරළේ "ඒ" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අම්බලම්මුල්ල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර $1\frac{1}{2}$ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි තල්ගහවත්ත නමැති ඉඩම් කැබැල්ල:—

උතුරට: වතුර ඇල; නැගෙනහිරට: ඒ. ආතර් ප්‍රනාන්දු හිමිකම් කියන තල්ගහවත්ත සහ පාර; දකුණට: නැසී ගිය ඒ. අප්පු සිංඤෝ ප්‍රනාන්දුගේ උරුමක්කාරයින් හිමිකම් කියන තල්ගහ වත්ත සහ ඩී. පොඩිනෝනා හිමිකම් කියන තල්ගහවත්ත; බටහිරට: කුඹුරු වලට වතුර ගනු ලබන ඇළ පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක: ජේ 60/61 එල් 302 (වීඊ)—කිව්ඒ 756.

1962 පෙබරවාරි මස 7 වන දින,
කොළඹ දී ය.

2-754

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම/පරවශතාව මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර හා යටිනුවර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, දෙහිපාගොඩ ගම්මුලාදෑනි වසමේ දෙහිපාගොඩ ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 3.2 ක් පමණ වූ කෙල්ලමදෙණිය නැමැති ඉඩමේ පහත සඳහන් මායිම් ඇතුළත පිහිටි කොටස:—

උතුරට: ගෙලිඔය ඇම්බැක්ක පාරේ 1/6 පාලමේ වතුර පිටවන කානුව; නැගෙනහිරට: එම ඉඩමේ ඉතිරි කොටස; දකුණට සහ බටහිරට: ගෙලිඔය-ඇම්බැකක ප්‍රසිද්ධ පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

සඳහන් අංකය: ජේ. 61/62 ව 49/ඇල්ඩී/ඊ/64.

1962 ජනවාරි මස 27 දින,
කොළඹ දී ය.

2-664

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාය්‍යීයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්‍ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ වටගොඩ ගම්මුලාදෑනි කොට්ඨාශයේ, වටගොඩ ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අක්කර $2\frac{1}{2}$ ක් පමණ වූ රතුපස්කැටිය නමැති ඉඩම් කැබලි දෙකට මායිම්:—

(ඉඩම මැදින් වැටී ඇති වටගොඩ අංකුඹුර ගම්සභා පාර අත්හැර)

උතුරට: වටගොඩ මිශ්‍ර පාසැල් භූමිය සහ ඇම්. දයානන්ද අයිතිකම් කියන රතුපස්කැටිය නමැති ඉඩම; නැගෙනහිරට: පී. ඇම්. උක්කුවා විසින් අයිතිවාසිකම් කියනු ලබන අඹුගල්දෙනියෙ වත්ත; දකුණට: මල්වඩම්ගෙදර මැණිකා විසින් අයිතිවාසිකම් කියනු ලබන බෙරුවේ වත්ත හා ඇම්. දයානන්ද විසින් අයිතිවාසිකම් කියනු ලබන රතුපස්කැටියෙවත්ත; බස්නාහිරට: අපුල්ලනගෙදර පිංචා, පුංචා උක්කුවා සහ සිරිමලා යන අය විසින් අයිතිවාසිකම් කියනු ලබන අපුල්ලනගෙදරවත්ත.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්‍ම, ඉඩම්, වාරිමාර්‍ග හා විදුලිබල ඇමති.

සඳහන් අංකය: ජේ. 56 ඊ 14—ඇල්. ඩී/4948.

1962 ජනවාරි මස 17 දින,
කොළඹ දී ය.

2-717

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥා පනතින් සංශොධිත 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950 හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුබුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මස්කෙළිය ගම්මුලාදෑනි වසමෙහි මස්කෙළිය ගමෙහි පිහිටි ග්ලෙන්ටිල්ට් වත්ත නැමැති ඉඩමෙන් අක්කර 5 රූඩ් 0, පර්චස් 0 පමණ වූ ඉඩම් කොටසට මායිම් :—

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : හැටන්—ඩෙල්හවුස් ප්‍රසිද්ධ පාර, ෂෙල් පැට්රල් ගබඩාව, ඒ ඇල්. ඒ. සුගතදාස සහ අනිකුත් අයගේ කඩ සහ මිරන්ඩා සහ සමාගමට අයත් ගොඩනැගිල්ල ; බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මස්කෙළිය කඩ වීදිය.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

සඳහන් අංකය : ජේ 60/61 එස් 487/ඇල්ඩී/ඩී.92.

1962 පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ දීය.

2—752

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ සංශොධිත ආඥාපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥා පනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥා පනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥා පනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥා පනතේ 5 වෙනි වගන්තියේ 1 වෙනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මඩකලපු දිස්ත්‍රික්කයේ එරාවුර් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ වෙංගලාඩි ගම්මුලාදෑනි වසමේහි වෙංගලාඩි ගමේ පිහිටා තිබෙන කම්බන්කට්ටිනචෝලේ නමැති ප්‍රමාණයෙන් අ. 1, රූ. 3, ප. 0.½ පමණවූ යාබද ඉඩම් කෑබලි 2කට මායිම් :—

උතුරට : ඒ. වෙල්ලතුරේ අයිතිකම් කියන වර්තකරවලවූ නැමති ඉඩම ; නැගෙනහිරට : මඩකලපු—බදුල්ල පාර ; දකුණට : පවු මාවත ; බස්නාහිරට : කෝට්ටමුනේ රාම්ලිංගම් රාජදුරේ අයිති කම් කියන අරෙයිපතිසිවලවූ නමැති ඉඩම.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

අංක ජේ 59/60 එල්ජ 99.

1962 ජනවාරි මස 16 වෙනි දින කොළඹදීය.

2-691

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

1. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වට්ටැහැපිටිය පළාතේ, තෝරකොටුව නැමැති ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අඩි 12×145 පමණ විශාල වූ බෙලිගහමුල වත්ත නොහොත් කෝන්ගහමුලගේන සහ මීගහමුලවත්ත (අංක 2418 දරණ අ. ග. සැ. කට්ටි නො. 11 සහ 12) නැමැති ඉඩම් කොටස් දෙකට මායිම් :—

උතුරට : ඒ. පී. ඉස්මාලෙබ්බෙ සහ තවත් අයෙක් හිමිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස (අංක 2418 දරණ අ. ග. සැ. කට්ටි නො. 11 සහ 12) ; නැගෙනහිරට : මිණිපිටියට යන ගම්සභා පාර (අංක 2418 දරන අ. ග. සැ. කට්ටි නො. 13) ; දකුණට : අයි. ඇල්. අබ්දුල් හමීදු සහ අනිකුත් අය හිමිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස (අංක 2418 දරණ අ. ග. සැ. කට්ටි නො. 11 සහ 12); බස්නාහිරට : තෝරකොටුව පාසැල් වත්ත (අංක 2418 දරන අ. ග. සැ. කට්ටි නො. 12).

2. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වට්ටැහැපිටිය පළාතේ, තෝරකොටුව නමැති ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, ප. 0, පමණවූ කෝන්ගහමුල වත්ත (අංක 2418 දරණ අ. ග. සැ. කට්ටි නො. 11) නමැති ඉඩම් කොටසට මායිම් :—

උතුරට : අයි. ඇල්. රෂීන් සහ තවත් අය හිමිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙණහිරට : පල්ලිය හිමිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : අයි. ඇල්. රෂීන් සහ තවත් අය හිමිකම් කියන මීගහමුලවත්ත නැමැති ඉඩම (අංක 2418 දරණ අ. ග. සැ. කට්ටි නො. 12) ; බස්නාහිරට : අයි. ඇල්. රෂීන් සහ තවත් අය හිමිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස.

3. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වට්ටැහැපිටිය පළාතේ, තෝරකොටුව නැමැති ගමෙහි පිහිටි ප්‍රමාණයෙන්, අ. 0, රූ. 1, ප. 0, පමණ වූ, මීගහමුලවත්ත (අංක 2418 දරණ අ. ග. සැ. කට්ටි නො. 12) නැමැති ඉඩම් කොටසට මායිම් :—

උතුරට : පල්ලිය අයිතිකම් කියන කෝන්ගහමුලවත්ත නැමති ඉඩම (අංක 2418 දරණ අ. ග. සැ. කට්ටි නො. 11) ; නැගෙණහිරට සහ බස්නාහිරට : අයි. ඇල්. අබ්දුල් හමීදු සහ තවත් අය හිමිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : යූ. ඇල්. ඉස්මයිල් සහ තවත් අය හිමිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය. ජේ 59/60 ඊ 768

1961 ඔක්තෝබර් මස 24 වැනි දින,
කොළඹ දීය.

2—753

---

ඇල්.ඩී.—බී. 80/51.

### සංශොධනයයි

#### 36 වෙනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ ආඥාව

#### 1961 අංක 333 දරණ ආඥාව

1961 සැප්තැම්බර් 22 දින අංක 12,688 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ III වෙනි කොටසේ 578 වෙනි පිටුවේ පළවී ඇති දැන්වීමේ II වැනි තීරයේ ඉඩමේ විස්තරය යටතේ ඉඩමේ ප්‍රමාණය අ. 0, රූ. 0, පා. 16 නොව අ. 0, රූ. 1, ප. 16 කියා කියවිය යුතුයි.

9-813

---

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත, 1950 අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥා පනත.

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය : ආර්. සී. 89.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය ජහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥා පනතින් සංශොධිත, 1950 අංක 9 දරන ඉඩම් ලබා ගැනීමේ ආඥා පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්හි විස්තර.

මූලික සැලැස්ම : අංක ඒ. 4796

පිහිටීම : උතුරු අලුත්කුරු කෝරලයේ "බී" කොට්ඨාශයේ දූනගහ පත්තුවේ, කිඹුලාපිටිය සහ දාගොන්න යන ග්‍රාමයන්.

**කැබැල්ල 1.**

නම: හොරගේන; විස්තරය: අවු. 20 ක පොල්, කොස්, සහ අඹගස්, ස්ථිර ගොඩනැගිලි 5 ක් ස්ථිර සිමෙන්ති ගොඩනැගිලි 3ක්, ස්ථිර වැසිකිලියක්, කපරාරුකළ අත්තිවාරම් 9 ක්, තවත් කපරාරු කළ අත්තිවාරමක කොටසක් සහ විශාල ලිපක්ද සහිත පොල් ඉඩම; අයිතිකම් කියන අය: ඒ. ඇන්. ඩී. ඒ. අබේසිංහ මහතා, මීගමුව; ප්‍රමාණය: අ. 6, රූ. 2, පර්. 24.

**කැබැල්ල 2.**

නම: හොරගේන; විස්තරය: කපරාරුකළ අත්තිවාරමක කොටසක් සහිත (වැවිලි රහිත) පොල් ඉඩමේ කොටස; අයිතිකම් කියන අය: රජය (මීගමුවේ ඒ. ඇන්. ඩී. ඒ අබේසිංහ මහතා බලෙන් අල්ලාගෙන තිබේ.); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප.14.

**කැබැල්ල 3.**

නම: වනම්ගහවත්ත; විස්තරය: අවු. 20 ක පොල්ගස් 66 ක්, අවු. 10 පොල්ගස් 13 ක්, අවු. 5 ක අඹගස් 13 ක්, අවු. 10 ක දොඩම් ගසක්, අවු. 5 ක දෙහිගස් 2 ක්, ස්ථිර ගොඩනැගිලි 4 ක්, සථිර ගොඩනැගිල්ලක කොටසක්, කපරාරු කරන ලද ළිඳක් සහ වානේ වතුර ටැන්කියක්, කපරාරු කළ අත්තිවාරම් හා ගෙබිම් 6ක් සහ තාවකාලික ගොඩනැගිල්ලක් සහිත ඉඩම; අයිතිකම් කියන අය: ඊ. දොන් ජේම්ස් අප්පුහාමි මහතා, දාගොන්න, දෙමන්හන්දිය; ප්‍රමාණය: අ. 2, රූ. 0, ප. 01.

**කැබැල්ල 4.**

නම: වනම්ගහවත්ත; විස්තරය: අවු. 20 ක පොල්ගස් 20 ක්, අවු. 5—10 ක පොල්ගසක්, අවු. 3 ක දෙහි ගසක්, අවු. 12 ක නැදුන් ගසක්, සථිර ගොඩනැගිල්ලක් සහ තවත් සථිර ගොඩනැගිල්ලෙක කොටසක් සහිත වත්ත; අයිතිකම් කියන අය: ඊ. ඒ. දොන් මර්සලින් අප්පුහාමි මහතා, කිඹුලාපිටිය, මීගමුව; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 28.

**කැබැල්ල 5.**

නම: වනම්ගහවත්ත; විස්තරය: අවු. 20 ක පොල්ගස් 80 ක්, අවු. 10ක පොල්ගස් 9ක්, අවු. 20ක රටදෙල් ගසක්, අවු. 5 ක කජු ගසක්, සථිර ගොඩනැගිලි 4 ක්, තාවකාලික පැලක්, සහ කපරාරු කළ අත්තිවාරම් හා ගෙබිම් 5 ක් සහිත ඉඩම; අයිතිකම් කියන අය: 1. ඊ. දොන් එලියස් අප්පුහාමි මහතා සහ 2. ඊ. ඒ. දෝන පුංචි නෝනා මහත්මිය, දෙදෙනාම දාගොන්න, දෙමන්හන්දිය; ප්‍රමාණය: අ. 2, රූ. 2, ප. 10.

**කැබැල්ල 6.**

නම: කැටකාලගහ වත්ත; විස්තරය: අවු. 20 ක පොල්ගස් සහ ප්‍රයෝජනයෙන් අත්හළ බිං ළිඳක් සහිත පොල් ඉඩම; අයිතිකම් කියන අය: ජී. ඒ. ඇෆ්. අබේසුන්දර මහත්මිය, "ද මැනර්", බගතලේ පාර, කොළඹ 3; ප්‍රමාණය: අ. 6, රූ. 2, ප. 16.

**කැබැල්ල 7.**

නම: කැටකාලගහ වත්ත; විස්තරය: (වැවිලි රහිත) පොල් ඉඩමේ කොටස; අයිතිකම් කියන අය: රජය. (කොළඹ බගතලේ පාරේ "ද මැනර්" හි ජී. ඒ. ඇෆ්. අබේසුන්දර මහත්මිය බලෙන් අල්ලා ගෙන තිබේ); ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 09.

**කැබැල්ල 8.**

නම: දාගොන්න වතුයාය; විස්තරය: අවු. 20ක පොල්ගස් සහිත පොල් ඉඩම; අයිතිකම් කියන අය: ජී. ඒ. ඇෆ්. අබේසුන්දර මහත්මිය, "ද මැනර්", බගතලේ පාර, කොළඹ 3; ප්‍රමාණය: අ. 12, රූ. 0, ප. 20.

**කැබැල්ල 9.**

නම: පරගහදෙනිය; විස්තරය: දෙනිය; අයිතිකම් කියන අය: ජී. ඒ. ඇෆ්. අබේසුන්දර මහත්මිය, "ද මැනර්" බගතලේ පාර, කොළඹ 3; ප්‍රමාණය: අ. 1, රූ. 0, ප. 24.

**විභාග පවත්වන වේලාවන්**

1 සහ 2 වැනි කැබැලි—පෙරවරු 10 ට

3 වෙනි කැබැල්ල—පෙරවරු 10.30 ට

4 වෙනි කැබැල්ල—පෙරවරු 10.45 ට

5 වෙනි කැබැල්ල—පෙරවරු 11 ට

6, 7, 8, සහ 9 කැබැලි—පෙරවරු 11.15 ට.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින, සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 1962 අප්‍රේල් 3 වෙනි දින ඉහත සඳහන් වේලාවන් අනුව කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1962 මාර්තු 24 වෙනිදාට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

වී. පී. ඒ. පෙරේරා,
කොළඹ රජයේ අතිරේක දිසාපති.

1962 පෙබරවාරි මස 15 වැනි දින,
කොළඹ කච්චේරියේදීය.

2—684

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

මූලික සැලැස්මේ අංක: ඒ 4,833; ගම: කොරලවැල්ල—මොරටු පළාත් ආණ්ඩු සීමාව තුළ—වෝඩ් අංක 10

**කැබැල්ල: 1.**

ඉඩමේ නම: කොරලවැල්ල පාරේ වරිපනම් අංක 128 දරන ඉඩමේ කොටසක්, 128ඒ, 128/2, 128/7, සහ 130/10 දරන දොඹගහවත්ත, නුගගහවත්ත සහ මාදන්ගහවත්ත; විස්තරය: මැටියෙන් තැනූ ගෙවල් දෙකක කොටස්, මැටියෙන් තැනූ ගෙවල් දෙකක්, අවු. 5ක පොල් පැල 4ක්, අවු. 15-20 පොල් ගස් 270ක් ඇති පොල් ඉඩම; අයිතිවාසිකම් කියන අය: නැසීගිය ආර්. ජේ. ජී. ද මැල් මහතාගේ හිමිකාරයින්—බලකාරයා: රොනී ද මැල් මහතා, 79/1, බාර්න්ස් පෙදෙස, කොළඹ; ප්‍රමාණය: අ. 2, රූ. 1, ප. 18.3.

**කැබැල්ල: 2.**

ඉඩමේ නම: අඩි පාරක්; විස්තරය: අඩි පාරක්; අයිතිවාසිකම් කියන අය: නැසීගිය ආර්. ජේ. ජී. ද මැල් මහාගේ හිමිකාරයින්—බලකාරයා: රොනී ද මැල් මහතා, 79/1, බාර්න්ස් පෙදෙස, කොළඹ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 12.4.

**කැබැල්ල: 3.**

ඉඩමේ නම: කොරලවැල්ලේ පාරේ වරිපනම් අංක 128 දරන ඉඩමේ කොටසක් සහ අංක 128/5, 128/6 දරන දොඹගහවත්ත, නුගගහවත්ත සහ මාදන්ගහවත්ත; විස්තරය: මැටියෙන් තැනූ ගෙයක් සහ අවු. 15-40 පොල් ගස් 62 ඇති පොල් ඉඩම; අයිතිවාසිකම් කියන අය: නැසීගිය ආර්. ජේ. ජී. ද මැල් මහතාගේ හිමිකාරයින්—බලකාරයා: රොනී ද මැල් මහතා, 79/1, බාර්න්ස් පෙදෙස, කොළඹ; ප්‍රමාණය: අ. 0, රූ. 3, ප. 09.6.

**එකතුව: අ. 3, රූ. 1, ප. 0.3.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 1962 අප්‍රේල් 10 වැනි දින පූ. භා. 10.30ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1962 අප්‍රේල් මස 2 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. මේ සම්බන්ධයෙන් අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු සහ අනිකුත් ලියකියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

බී. සී. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ අතිරේක
උප ඒජන්තතුමා.

අංක කිව්. ඊ. 96.
1962 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ කච්චේරිය.

2-714

සඳහන් අංකය : කිච්බි. 525/කිච්ඒ. 343.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමෙ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

මූලික සිතියම අංක : ඒ. 4,767—ගම : විතානමුල්ල

**කැබලි අංක : 1.**

නම : කොස්ගහලන්ද ; විස්තර : අවුරුදු 30-40 වයස පොල් ගස් 3යි, අවුරුදු 10-14 වයස පොල් ගස් 4යි, අවුරුදු 5-7 වයස පොල් ගස් 7යි, අවුරුදු 15-20 වයස කොස් ගස් 1යි, අවුරුදු 4-6 වයස කොස් ගස් 1යි, අවුරුදු 7-10 වයස හොරගස් 7ක් හා අවුරුදු 8-12 වයස පුවක් ගස් 14ක් සහිත පොල් ඉඩම ; හිමිකම් කියන අය : දිවුලපිටියේ විතානමුල්ලේ ආර්. ඒ. පබිලිස් අප්පුහාමි සහ ආර්. ඒ. තෝමිස් අප්පුහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 17.

**කැබලි අංක : 2.**

නම : කොස්ගහලන්ද ; විස්තර : අවුරුදු 30-40 වයස කජුගස් 1ක් හා අවුරුදු 8-12 වයස කජුගස් 3ක් සහිත පොල් ඉඩම ; හිමිකම් කියන අය : විතානමුල්ලේ ආර්. ඒ. රබියෙල් අප්පුහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.1.

**කැබලි අංක : 3.**

නම : කොස්ගහලන්ද ; විස්තර : අවුරුදු 30-40 වයස පොල් ගස් 7යි, අවුරුදු 5-7 වයස පොල් ගස් 3ක් හා අවුරුදු 7-10 වයස හොර ගස් 1ක් සහිත පොල් ඉඩම ; හිමිකම් කියන අය : දිවුලපිටියේ, විතානමුල්ලේ ආර්. ඒ. අප්පුසිංඤෝ ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 13.1.

**කැබලි අංක : 4.**

නම : කොස්ගහලන්ද ; විස්තර : අවුරුදු 40-50 වයස පොල් ගස් 3යි, අවුරුදු 30-40 වයස අඹගස් 1ක් හා අවුරුදු 8-12 වයස හොර ගස් 21ක් සහිත පොල් ඉඩම ; හිමිකම් කියන අය : දිවුලපිටියේ, විතානමුල්ලේ ඇම්. ජේ. පී. විලියම් අප්පුහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.2.

**කැබලි අංක : 5.**

නම : ගල්මොරටුගහකුඹුර ; විස්තර : කුඹුර ; හිමිකම් කියන අය : දිවුලපිටියේ, විතානමුල්ලේ කේ. ආර්. කේ. චාර්ලිස් රණවීර ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 09.6.

**කැබලි අංක : 6.**

නම : ගල්මොරටුගහකුඹුර ; විස්තර : කුඹුර ; හිමිකම් කියන අය : දිවුලපිටියේ, විතානමුල්ලේ කේ. ආර්. කේ. සර්නේලිස් රණවීර ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.8.

**කැබලි අංක : 7.**

නම : කෝන්ගහවත්ත ; විස්තර : අවු. 40-60 වයස පොල් ගස් 15ක් හා අවු. 20-30 වයස පොල් ගස් 9ක් සහිත පොල් ඉඩම ; හිමිකම් කියන අය : හිඟුරක්ගොඩ ඩබ්ලිව්. ඒ. කරුණාරත්න ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 12.1.

**එකතුව : අ. 0, රූ. 1, ප. 35.9.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 අප්‍රෙල් මස 5 වැනි දින පූ. භා. 9.30ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 මාර්තු මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම් දිය යුතුයි. ඉඩම්වලට ඇති අයිතිය පෙන්වීමට ඔප්පු හා වෙනත් ලියකියවිලි මෙම විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

බී. සී. පෙරේරා,
කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක
උප දිසාපති.

1962 පෙබරවාරි මස 15 වැනි දින,
කොළඹ කච්චේරිය.

2-713

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

ඇල්එච්/ඒ 4083.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

අ. ග. සැ. නො. 78 අතිරේක 9 කැ. නො. 557—බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බටහිර පස්දුන් කෝරළයේ වලල්ලාවිට පත්තුවේ ඉත්තැපාන ගම

**කැ. නො. 557.**

නම : පින්වත්ත ; විස්තර : අවුරුදු 30 වැඩි පොල්ගස් 6, අවුරුදු 20-30 රබර් ගස් 75, අවුරුදු 4-6 රබර් ගස් 4, ගොරොක් ගස් 1 "අතර වගා කර ඇත" ඉවුර සහ උළු සෙවිලි කළ බදාමෙන් තැනූ ගොඩනැගිලි 1 ; අයිතිකරුවෝ : ඉත්තැපාන පොල්දුවේ පී. දෝන සැසිනෝනා වීරකෝන්, පී. දොන් පීටර් වීරකෝන් (ගොඩනැගිල්ල වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුය) ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 21.0.

**මුළු ගණන : අ. 0, රූ. 2, ප. 21.0.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962.5.10 වැනි දින පූ. භා. 9.15ට මතුගම ප්‍රාදේශීය ආදායම් පාලක කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962.5.2 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

සී. ආර්. ද සිල්වා.
ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1962 පෙබරවාරි 14 වැනි දින,
කළුතර කච්චේරිය.

2-775

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය : ඇල්.ඞී./ඒ. 49.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ පාතහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, හේවාවිස්ස කෝරලේ, වනහපුව සහ බෝපිටිය නැමති ගම්වල පිහිටි බෝපිටිය වත්තේ මාළුස්සාව කොටසෙන් ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ්. 1, පර්චස් 11.7 ක්වූ සීමාසහිත බෝපිටිය වතුයාය විසින් අයිතිවාසිකම් කියනු ලබන (ඒජන්තවරු : සීමාසහිත කම්බරබැච් සහ සමාගම, තැ. පෙ. 24, කොළඹ 1) මූලික සිතියම් අංක ඒ. 2,788 හි කැබලි අංක 1 සහ 2ක වශයෙන් මැන විස්තර කර ඇති එකට යාබදවූ ඉඩම් කැබලි දෙක.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 ක්වූ මාර්තු මස 26 වැනි දින පූ. භා. 10 ට මහනුවර දිසාපති කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 ක්වූ මාර්තු මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතුයි. තවද, එකී ඉඩම

සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරගැනීම සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණයත් සම්බන්ධවද ඇති සියලු ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

පී. එච්. ප්‍රේමවර්ධන,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1962 පෙබරවාරි මස 16 වැනි දින,
මහනුවර කච්චේරිය.

2-715

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

සඳහන් අංක: එල්.ඩී./බී 58.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පල්ලේගම්පහ කෝරලේ, උඩගම පල්ලේගම වසමේ උඩගම පල්ලේගම ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 2, රූඩ් 0, පර්චස් 14.5 ක් පමණ ඇති නුගේගොඩ උඩහමුල්ලේ පදිංචි ඩබ්ලිව්. ජේ. ආර්. පොන්සේකා මහතා විසින්ද, පත්විල දොඹන්වත්තේ තැන්නේහේන පදිංචි පී. ආර්. විජේරත්න විසින්ද, පත්විල උඩගම පල්ලේගම ඩී. එච්. පුන්චි නොහොත් සෝමා විසින්ද, පත්විල උඩගම පල්ලේගම පදිංචි පී. ජී. ලීලාවතී විසින්ද, අඹතැන්නේ දිවන වත්තේ පුවක්ගහකුඹුරේ ගෙදර පදිංචි පී. ජී. ප්‍රේමාවතී විසින්ද අයිතිවාසිකම් කියනු ලබන මූලික සිතියම් අංක ඒ 2,878 සහ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කරන දොඹන්වත්තේ තැන්නේහේන නමැති ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 1962 මාර්තු 26 වැනි දින පූ. භා. 11ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1962 මාර්තු 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලන ලද වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුය.

පී. එච්. ප්‍රේමවර්ධන,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1962 පෙබරවාරි 16 වැනි දින,
මහනුවර කච්චේරිය.

2-776

---

## 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: ඇල්ඒ 1176

මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

යාපනය දිස්ත්‍රික්කයේ වඩමරාච්චි ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුප්පිඩි ගමේ පිහිටි මුන්රම් සන්නිකුලඩ්ඩි නැමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0, රූ. 3, ප. 14.3 ක්වූ මූලික සිතියමේ අංක ඒ 2321 හි කැබලි 1 සහ 2 වශයෙන් මැන විස්තර කරන ලද ඉඩම් කොටස.

මෙම ඉඩම් කොටසට අයිතිවාසිකම් කියා සිටින්නන්ගේ නම් සහ ලිපිනයන් :—

වෙල්වැට්තුරේ කොම්මන්තරයි අරුනාසලම් සින්නතම්බි සහ එම ගමෙහි කිඩ්නාර් වේලුපිල්ලේ.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1962 මාර්තු මස 29 වැනි දින පෙරවරු 10 ට යාපනය කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1962 මාර්තු 21 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

අයිවන් සමරවික්‍රම,
යාපන දිස්ත්‍රික්කයේ උප දිසාපති.

යාපනය කච්චේරිය,
1962 පෙබරවාරි මස 16 වෙනි දය.

2-716

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

යොමු අංකය: ජේ 57/58 ඊ 689/එල්ඞී/3825

පොදු කටයුත්තක්—එනම් මදි/වාලවේනෙයි රජයේ මුස්ලිම් පිරිමි පාසැල සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:—

පීපීඒ 1,388—ගමේ නම: වාලවෙනෙයි (මුස්ලිම්)

**කැබලි අංකය: 1.**

ඉඩමේ නම: සෙයිලම්පෙත්තවෙට්ට; විස්තර: අවුරුදු 20-25 ක් වයසැති පොල් ගස් 29ක්ද, අවුරුදු 2-5ක් වයසැති පොල් ගස් 40ක්ද, අවුරුදු 5-10ක් වයසැති අඹ ගස් 2ක්ද, අවුරුදු 5-25ක් වයසැති කොහොඹ ගස් 27 ද, අවුරුදු 5-10ක් වයසැති පුවක් ගස් 16 ද එක ස්ථිර ගොඩනැගිල්ලකින්ද, එක ස්ථිර වැසිකිලියකින් ද, තාවකාලික ගොඩනැගිලි 2 ද සහ බැඳපු ගල්වලින් යුත් ළිං 3ක් යුත් පොල් වත්තක්; අයිතිවාසිකම් කියන්නෝ: ආදම්ලෙබ්බේ අසනාර්ලෙබ්බේගේ වැන්දඹුවූ වෙල්ලාඋම්මා, මීරාසයිබු උදුමා ලෙබ්බේ, මීරාසයිබු උමාරුලෙබ්බේ සහ ඊබ්රාලෙබ්බේ ඔහුතු මොහමඩ් හජ්ජියාර්, මේ සියළු දෙනාම, වාලවෙනෙයි අංක 5 දරණ කොටසෙයි; ප්‍රමාණය: අ. 0, රූ. 3. ප. 14.8

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි-වලින් බලය ලත් අයවලුන් හෝ 1962 කේ මාර්තු මස 29 වෙනි දින පූ. භා. 10.00 වේලාවට වාලවෙනෙයි කෝරල පත්තු ප්‍රා. ආ. නිලධාරියාගේ කාර්‍යාලයේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1962 කේ මාර්තු මස 19 වෙනි දින දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

විභාගය පවත්වන දිනයේදී අයිතිවාසිකම් ඔප්පු කිරීමට ඇති සියළුම ලියකියවිලි මවෙත ඉදිරිපත් කළ යුතුයි. වාලවෙනෙයි (මුස්ලිම්) ගම්පති ලඟ අත්කර ගැනීමට යන ඉඩමේ සැලැස්මක් ඇත. විභාගයට ඉදිරිපත් වීමට ප්‍රථමයෙන්, අයිතිවාසිකම කියන්නන් සැලැස්ම මනා ලෙස බලා, අවශ්‍ය වුවහොත් ඉඩමද පරීක්ෂාකර බලා අයිතිවාසිකම් ඉදිරිපත් කළයුතුයි.

ඞී. ඒ. එල්. ප්‍රබෝධසිංහ,
මඩකලපුව දිස්ත්‍රික්කයේ උප දිසාපති.

1. 2
1962——දින,
2. 10
මඩකලපුව කච්චේරියේදිය.

2-244

